# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# மத்தியமாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
# Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොටපාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*

e-mail: *psc.cp.gov@gmail.com*

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාරලේකම්<br>உதவிசெயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේඅංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/40/18/2026 | ඔබේඅංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2026.03.20 |

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියලුම ආයතන ප්‍රධානීන් වෙත,

**<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026</u>**

උක්ත කරුණට අදාළව නිකුත් කරන ලද මාගේ අංක:CPC/PSC/40/18/2026 හා 2025.11.14, CPC/PSC/28/26/2026 හා 2025.11.27, CPC/PSC/8/3/27/2026 හා 2025.12.16 සහ CPC/PSC/9/1/1/2026-I හා 2026.02.16 දිනැති ලිපි වලට වැඩිමනක් වශයෙනි.

02. ඒ අනුව, මේ වන විට පහත සේවාවන්වලට අදාළව අවසන් වාර්ෂික ස්ථානමාරු නියෝග දැනුම්දී ඇති අතර, ඉන් පසුවත් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා සඳහාද අවසන් තීරණ දැනුම් දී අවසන් කර ඇති බැවින් 2026.04.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික ස්ථානමාරු නියෝග ලබා ඇති සියලුම නිලධාරීන් 2026.03.31 දින සේවයෙන් පසු (2026.04.01 රජයේ නිවාඩු දිනයක් වන බැවින්) නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි නිදහස් කළ යුතු බව අවධාරණය කරමි.

- i මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරී සේවය
- ii මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවය
- iii මධ්‍යම පළාත් තාක්ෂණ සේවය
- iv මධ්‍යම පළාත් මෝටර් රථ රියදුරු සේවය
- v මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවය

03. තවද, කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 257 වගන්තිය කෙරෙහිද ඔබගේ කාරුණික අවධානය යොමු කරන අතර, ඒ අනුව වාර්ෂික ස්ථානමාරු නියෝග ලද නිලධාරීන්ගේ අනුප්‍රාප්තික නිලධාරීන් පැමිණෙනතෙක් නොසිට, එම නිලධාරීන් නිදහස් කිරීමට අදාළව පූර්ව සූදානමක් සහිතව ඉදිරි කටයුතු සිදු කිරීමට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතු බව වැඩිදුරටත් අවධාරණය කරමි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.ජී.විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත.

පිටපත :
01. විගණකාධිපති - අ.ක.ස.